# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1971/12 - 2016 ජුනි මස 15 වැනි බදාදා - 2016.06.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, මෙම උපලේඛනයේ I සහ II හි I වැනි තීරුවේ නිශ්චිතව දක්වා ඇත්තා වූද, එම ලේඛනයේ II වැනි තීරුවෙහි අනුරූප සටහනේ සඳහන් මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තාවූ ද, ප්‍රදේශ සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, එම ප්‍රදේශ එම වගන්තියේ කාර්යය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

පාඨලී චම්පික රණවක (පා.ම.)
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2016 ක් වූ ජුනි මස 09 වැනි දින,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය,
''සුහුරුපාය'',
17 වන මහල,
සුභූතිපුර පාර, බත්තරමුල්ල.

**උපලේඛනය I**

*අම්බලන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය*

*I වැනි තීරුව*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රය* අනුව නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කළ අංක : 223/16 හා 1982.12.17 දින දරන ශ්‍රී ලංකාවේ වෙරළබඩ කලාපය ද, අංක 74/7 හා 1992.12.29 දින දරන මාතර - කතරගම දුම්රිය මාර්ග කලාපීය නාගරික සංවර්ධන ප්‍රදේශය ද, අංක : 1090/5 හා 1999.07.26 දින දරන *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශ ද, අංක 1605/41 හා 2009.06.11 දින දරන *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශයන්ට අමතරව දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් සමන්විත වූ මෙහි II වැනි තීරුවෙන් විස්තර වන්නා වූ මුළු මහත් භූමි ප්‍රමාණය වේ.

*II වැනි තීරුව*

උතුරට -

පදලංගල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම හා දික්වැව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඡේදනය වන ලක්ෂ්‍යයේ සිට ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ නැගෙනහිර, ගිණිකොන, ඊසාන, ගිණිකොන, ඊසාන, ගිණිකොන දිසා ඔස්සේ නැගෙනහිර දෙසට ගමන්කර, සූරියවැය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද වේ.


1A - G 23650 — 55 (2016/06)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය (සම්බන්ධිතයි)

*අම්බලන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
| --- | --- |
| | නැගෙනහිරට ඃ<br><br>අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගිණිකොන, දකුණ, ගිණිකොන, දකුණ, නිරිත, ගිණිකොන දිසා ඔස්සේ ගමන් කර එතැන් සිට හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ ගිණිකොන නිරිත, ගිණිකොන, නිරිත ගිණිකොන, දකුණ, නිරිත, දකුණ, ගිණිකොන, නිරිත, ගිණිකොන දිසා ඔස්සේ ගමන්කර ඉන්දියන් සාගරයේ වඩදිය රේඛාව ඡේදනය වන ලක්ෂ්‍ය දක්වා ද වේ.<br><br>දකුණට ඃ<br><br>අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට ඉන්දියන් සාගරයේ වඩදිය රේඛාව ඔස්සේ බටහිර, නිරිත, වයඹ, ගිණිකොන, ඊසාන, වයඹ, බටහිර, නිරිත, බටහිර, නිරිත, වයඹ, නිරිත, බටහිර, ගිණිකොන දිසා ඔස්සේ ගමන් කර තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඡේදනය වන ලක්ෂ්‍ය දක්වා ද වේ.<br><br>බටහිර ඃ<br><br>අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ වයඹ දෙසට ගමන් කර එතැන් සිට අඟුණකොලපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ වයඹ, උතුර, ඊසාන, වයඹ, ඊසාන, වයඹ ඊසාන, වයඹ, ඊසාන, වයඹ, ඊසාන, වයඹ, ඊසාන හා වයඹ දිසා ඔස්සේ ගමන්කර ආරම්භක ලක්ෂ්‍යය දක්වා ද වේ. |

07 - 95

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.